ඉතාලිය

# මගේ පුද්ගලික දත්ත යුරෝඩැක් වෙත සම්ප්‍රේෂණය කරන්නේ ඇයි?

F ප්‍රකාරය

**ඒකාබද්ධ රාජ්‍ය නැවත පදිංචි කරවීමේ සහ මානුෂීය ඇතුළත් කිරීමේ රාමුව යටතේ ඇතුළත් කිරීමේ ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ලියාපදිංචි වූ පුද්ගලයින්**



SINHALESE

## මට මෙම විස්තර පත්‍රිකාව ලැබෙන්නේ ඇයි?

ඔබව යුරෝපීය සංගමයේ (EU) සාමාජික රටකට නැවත පදිංචි කරවීම හෝ මානුෂීය ඇතුළත් කිරීම සඳහා සලකා බලනු ලැබේ.

මෙම විස්තර පත්‍රිකාව බලධාරීන් විසින් ගබඩා කරගනු ලබන දත්ත පිළිබඳ ව සහ ඒ කොපමණ කාලයක් සඳහා ද යන්න පිළිබඳ ව වැඩිදුර තොරතුරු ලබා දෙයි.

## නැවත පදිංචි කරවීම සහ මානුෂීය ඇතුළත් කිරීම යනු කුමක්ද?



ඔබව යුරෝපා සංගමයේ සාමාජික රටකට නැවත පදිංචි කරවීම හෝ මානුෂීය ඇතුළත් කිරීම සඳහා සලකා බලනු ලැබේ. මෙයින් අදහස් වන්නේ ඔබේ තත්ත්වය එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (UNHCR) හෝ වෙනත් අදාළ ආයතනයක් විසින් ඇගයීමට ලක් කර ඇති බවයි

යුරෝපා සංගමයේ සාමාජික රටවලින් එක් රටක් දැන් ඔබව එම රටේ ජීවත් වීම සඳහා පිළිගැනීමට එකඟ වී ඔබට ජාත්‍යන්තර ආරක්ෂාව හෝ මානුෂීය ආරක්ෂණ තත්ත්වය ලබා දීමට එකඟ වේද යන්න තීරණය කරනු ඇත.

## මට මගේ ඇඟිලි සලකුණු සහ ඡායාරූපය ලබා දීමට සිදුවන්නේ ඇයි?

මේ රටේ බලධාරීන් ඔබේ ඇඟිලි සලකුණු සහ ඡායාරූප ලබා ගනු ඇත. මෙම දත්ත, ඔබේ අනන්‍යතාවය පිළිබඳ ව තොරතුරු සහ අනෙකුත් අදාළ තොරතුරු සමඟ යුරෝඩැක් දත්ත සමුදාය වෙත සම්ප්‍රේෂණය කෙරෙනු ඇත.

යුරෝඩැක් EU+ රටක ජාතිකයන් නොවන ඇතැම් කාණ්ඩවල පුද්ගලයින්ව ඔවුන්ගේ අනන්‍ය ඇඟිලි සලකුණු සහ ඡායාරූප කට්ටලය හා සම්බන්ධ කරයි.

මෙම දත්ත සමුදාය EU+ රටවල් 31ක් විසින් භාවිත කරනු ලබන අතර ඔවුන්ට ඔබේ තොරතුරු ලබාගැනීමට ඔබේ දත්ත සැකසීමේ හැකියාව ඇත.

ඔවුන් පහත සඳහන් දේ පිළිබඳ වපරීක්ෂා කරනු ඇත:

- ඔබට දැනටමත් EU+ රටක වලංගු ආරක්ෂණ තත්වයක් තිබේ ද
- ඔබව දැනටමත් යුරෝපා සංගමයේ සාමාජික රටක් විසින් නැවත පදිංචි කරවීම හෝ මානුෂීය ඇතුළත් කිරීම සඳහා පිළිගෙන තිබේ ද
- ආරක්ෂක හේතූන් මත පසුගිය වසර 3 තුළ යුරෝපා සංගමයේ සාමාජික රටක් විසින් ඔබේ අයදුම්පත ප්‍රතික්ෂේප කර තිබේ ද
- පසුගිය වසර 3 තුළ, ඔබ යුරෝපා සංගමයේ සාමාජික රටකට ඇතුළත් වීමට ඔබේ කැමැත්ත ලබා දී නොමැති ද හෝ ඉවත් කර ගෙන තිබේ ද.

ඔබේ තොරතුරු ලියාපදිංචි කරන යුරෝපා සංගමයේ සාමාජික රට ඉහත සඳහන් කිසිවක් ඔබට අදාළ වේද යන්න පමණක් මුලින් ම පරීක්ෂා කරනු ඇත. මෙම අවස්ථාවේ දී, ඔබේ තොරතුරු යුරෝඩැක් හි ගබඩා නොකෙරේ.

**ඔබ දැන් ඉතාලිය හි සිටින අතර, එය EU+ රටකි.**
**EU+ රටවල් වන්නේ:**

යුරෝපීය සංගමයේ (EU) සාමාජික රටවල් 27: ඔස්ට්‍රියාව, බෙල්ජියම, බල්ගේරියාව, ක්‍රොඒෂියාව, සයිප්‍රසය, චෙකියාව, ඩෙන්මාර්කය, එස්තෝනියාව, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, හංගේරියාව, ඉතාලිය, ලැට්වියාව, ලිතුවේනියාව, ලක්සම්බර්ග්, මෝල්ටාව, නෙදර්ලන්තය, පෝලන්තය, පෘතුගාලය, අයර්ලන්ත ජනරජය, රුමේනියාව, ස්ලෝවැකියාව, ස්ලෝවේනියාව, ස්පාඤ්ඤය, ස්වීඩනය සහ

අනෙකුත් රටවල් 4: අයිස්ලන්තය, ලීච්ටන්ස්ටයින්, නෝර්වේ, ස්විට්සර්ලන්තය.

## යුරෝඩැක්හි ගබඩා කර ඇති තොරතුරු මොනවාද?



පහත සඳහන් තොරතුරු සැමවිටම ගබඩා කෙරේ:

- ඔබේ ඇඟිලි සලකුණු
- ඔබේ මුහුණේ ඡායාරූපයක්
- ඔබ දැන් භාවිත කරන හෝ අතීතයේ භාවිත කර ඇති සියලුම නම්
- ඔබේ උපන් දිනය
- ඔබේ උපන් ස්ථානය
- ඔබේ ජාතිකත්වය හෝ ජාතිකත්වයන්
- ඔබේ ස්ත්‍රී පුරුෂභාවය
- ඔබ භාවිත කර තිබෙන අනන්‍යතා හෝ සංචාරක ලේඛනවල පිටපත්, තිබේ නම්, ඒවායේ සත්‍යතාව පිළිබඳ ව තොරතුරු ඇතුළුව
- ඔබේ ඇඟිලි සලකුණු සහ ඡායාරූපය ලබාගත් නිලධාරියාගේ පරිශීලක හැඳුනුම සහ ඔබේ දත්ත ලබාගෙන සම්ප්‍රේෂණය කළ දිනයන්
- ඔබව ඇතුළත් කර ගැනීම සඳහා ලියාපදිංචි කළ යුරෝපීය සංගමයේ සාමාජික රට සහ මෙය සිදු වූ ස්ථානය සහ දිනය.

අවශ්‍ය විටෙක පහත තොරතුරු ද යුරෝඩැක්හි ගබඩා කරනු ඇත :

- ඔබේ තොරතුරු ලියාපදිංචි කළ යුරෝපා සංගමයේ සාමාජික රට ඔබව ඇතුළත් කර ගැනීමට සහ ඔබට ජාත්‍යන්තර හෝ මානුෂීය ආරක්ෂාව ලබා දීමට එකඟ වන්නේ නම්, මෙම තීරණය ගත් දිනය
- ලියාපදිංචි යුරෝපා සංගමයේ සාමාජික රට විසින් ඔබව ඇතුළත් කර නොගත්තේ නම්, මෙම තීරණය ගත් දිනය සහ ඔවුන් ඔබව ඇතුළත් කර ගැනීම ප්‍රතික්ෂේප කිරීමට හේතුව
- ඔබේම තීරණය අනුව, යුරෝපා සංගමයේ සාමාජික රටක නැවත පදිංචි කරවීම සඳහා ඔබව තවදුරටත් සලකා බැලීමට අවශ්‍ය නොවන්නේ ද, නැතහොත් ඔබ ක්‍රියාවලියට සහයෝගය නොදැක්වීමෙන් පසු බලධාරීන් මෙය එසේ යැයි විශ්වාස කරන්නේ ද යන බව, උදාහරණයක් ලෙස ඔබ සම්මුඛ පරීක්ෂණයකට සහභාගී වීමට අපොහොසත් වුවහොත්.

යුරෝඩැක්හි ගබඩා කර ඇති සාවද්‍ය තොරතුරු වෙත ප්‍රවේශ වීමට සහ සංශෝධනය කිරීමත් එය නීති විරෝධී ලෙස හසුරුවා ඇත්නම් ඔබේ තොරතුරු මකා දැමීමට ඉල්ලා සිටීමත් ඔබට අයිතිය ඇත. මෙය සිදු කිරීම සඳහා ඔබට දත්ත පාලකය සම්බන්ධ කර ගත හැකිය. දත්ත පාලකයේ සම්බන්ධතා තොරතුරු '**යුරෝඩැක්හි වෙනත් තොරතුරු ගබඩා කර තිබේ ද?**' යන විස්තර පත්‍රිකාවෙන් සොයාගත හැකිය.

## මගේ පුද්ගලික දත්ත යුරෝඩැක්හි කොපමණ කාලයක් ගබඩා කර තිබෙනු ඇති ද?



එය තීරණය මත රඳා පවතින නමුත් පහත සඳහන් දෙයක් ද විය හැකියි:

- වසර 5ක්, ලියාපදිංචි කරන රට ඔබට ඇතුළත් වීමට ඉඩ ලබා දෙන්නේ නම් හෝ
- වසර 3ක්, ලියාපදිංචි කරන රට ආරක්ෂක හේතූන් මත ඔබව ඇතුළත් කර ගැනීම ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ
- වසර 3ක්, ඔබ තවදුරටත් ඇතුළත් වීමට අකමැති බව ඔබ තීරණය කරන්නේ නම් හෝ ඔබ සහයෝගයෙන් කටයුතු නොකළ නිසා මෙය ඊට හේතුව යැයි බලධාරීන් විශ්වාස කරන්නේ නම්.

මෙම කාල සීමාව ඉකුත්වීමට පෙර ඔබ EU+ රටක පුරවැසිභාවය ලබා ගන්නේ නම්, ඔබේ දත්ත මකා දැමෙනු ඇත. ඔබේ දත්ත මකා දැමුවහොත්, ඔබ පුරවැසිභාවය ලැබූ රටෙහි ඔබේ තත්ත්වයට මෙය බලපාන්නේ නැත.

මෙම සටහන දැනගැනීමේ අරමුණු සඳහා පමණි. එමගින් අයිතීන් හෝ වගකීම් නිර්මාණය නොකරයි. මෙම සටහනේ අන්තර්ගත තොරතුරු මගින් නිර්මාණය කළ හැකි යම් භාවිතයක් සඳහා EUAA හෝ EUAA වෙනුවෙන් ක්‍රියා කරන කිසිදු පුද්ගලයෙකු වගකිව යුතු නොවේ.

© European Union Agency for Asylum, 2025